# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 2021 අංක 13 දරන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන) පනත

**[සහතිකය සටහන් කළේ 2021 ජුනි මස 30 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

2021 ජූලි මස 02 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකි ය.

**මිල :** රු. 35.00 **තැපැල් ගාස්තුව :** රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2021 අංක 13 දරන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2021 ජුනි මස 30 වන දින]

එල්.ඩී.-ඕ 11/2012

### 1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2021 අංක 13 දරන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා පනතේ 2අ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- 1968 අංක 15 දරන පනතේ 2අ වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය." යන වචන වෙනුවට "වරදක් කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂයකට නොඅඩු සහ රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට හෝ වසරකට නොවැඩි කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "නීති විරෝධී ක්‍රියාකාරකම් කරගෙන යාමෙන් ඒ තැනැත්තා වළක්වාලීම සඳහා සියලු නිසි පියවර ඔහු විසින් ගත යුතු අතර," යන වචනවල සිට එම උපවගන්තියේ අවසානය දක්වා වූ සියලු වචන සහ ඉලක්කම් ඉවත්කොට ඒ වෙනුවට "නීති විරෝධී ක්‍රියාකාරකම් කරගෙන යාමෙන් ඒ තැනැත්තා වළක්වාලීම සඳහා සියලු නිසි පියවර ඔහු විසින් ගත යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ "අපොහොසත් වන අවස්ථාවක (1) වන උපවගන්තියේ විධිවිධාන කඩකරමින් ක්‍රියාකිරීමෙන්" යන වචන සහ ඉලක්කම්වල සිට "ප්‍රධාන විධායක නිලධරයා විසින් ඉල්ලීමක් කරනු ලැබිය

හැකි ය." යන වචන දක්වා කොටස ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"අපොහොසත් වන අවස්ථාවක-

(අ) (i) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩකරමින් ක්‍රියාකිරීමෙන් එම තැනැත්තා, ඔහුගේ අනුයෝජිතයන් සහ සේවකයන් වළක්වාලමින්;

(ii) (අඅ) ඒ ඉඩම් ප්‍රමාණයෙහි සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හෝ ඉදිකරන ලද යම් ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් බිඳ හෙළීමට;

(අආ) පිරවීමේ දී හෝ ඉදිකිරීමේ දී භාවිත කරන ලද පස් සහ ද්‍රව්‍ය කැණීමට හෝ පොළොවෙන් හාරා ඉවත් කිරීමට සහ ඉවත් කිරීමට; සහ

(අඇ) එම පිරවීමට හෝ ඉදිකිරීමට යොදා ගන්නා ලද යම් මෙවලමක්, උපකරණයක්, යන්ත්‍රෝපකරණයක්, වාහනයක් හෝ ලේඛනයක් භාරයට ගැනීමට,

ප්‍රධාන විධායක නිලධරයාට බලය ප්‍රදානය කරමින්; සහ

(iii) (අඅ) යම් ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් බිඳ හෙළීමේ දී;

(අආ) පිරවීමේ දී හෝ ඉදිකිරීමේ දී භාවිත කරන ලද පස් සහ ද්‍රව්‍ය කැණීමේ දී හෝ පොළොවෙන් හාරා ඉවත් කිරීමේ දී සහ ඉවත් කිරීමේ දී; සහ

(අඇ) එම පිරවීමට හෝ ඉදිකිරීමට යොදා ගන්නා ලද යම් මෙවලමක්, උපකරණයක්, යන්ත්‍රෝපකරණයක්, වාහනයක් හෝ ලේඛනයක් භාරයට ගැනීමේ දී,

සංස්ථාව විසින් දරන ලද සමස්ත පිරිවැය අයකර ගැනීමට,

ආඥාවක් නිකුත් කිරීම සඳහා, ඒ ඉඩම් ප්‍රමාණය හෝ එහි යම් කොටසක් පිහිටියේ යම් මහෙස්ත්‍රාත් අධිකරණයක අධිකරණ බලසීමාව ඇතුළත ද, ඒ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක්; හෝ

(ආ) නීති විරෝධී ක්‍රියාකාරකම කරගෙන යනු ලබන්නේ හෝ එම ක්‍රියාකාරකම සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක් සිදු කර ඇත්තේ යම් ඉඩම් ප්‍රමාණයක් හෝ එහි යම් කොටසක් ඇතුළත ද, ඒ ඉඩම් ප්‍රමාණය හෝ කොටස පිහිටා ඇති ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ ස්ථානභාර නිලධරයාට පැමිණිලි කිරීමක්,

ප්‍රධාන විධායක නිලධරයා විසින් කරනු ලැබිය හැකි ය.".

(4) එම වගන්තියේ (6) වන, (7) වන සහ (8) වන උපවගන්ති ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන්:-

"(6) (2) වන උපවගන්තිය යටතේ අනුමතය දෙන ලද්දේ යම් තැනැත්තකුට ද, ඒ තැනැත්තාට එම අනුමතය දෙනු ලැබුවේ යම් නියම සහ කොන්දේසිවලට යටත්ව ද, ඒ නියම සහ කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීම පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක, ප්‍රධාන විධායක නිලධරයා විසින් හෝ එම ප්‍රධාන විධායක නිලධරයා විසින් බලය පවරනු ලැබූ නිලධරයකු හෝ සේවකයකු විසින් කරනු ලබන විධානයේ නිශ්චිතව දක්වා ඇති කාලය ඇතුළත එකී නියම සහ කොන්දේසිවලට අනුකූලව කටයුතු කරන ලෙස ඒ තැනැත්තාට විධාන කරනු ලැබිය යුතු අතර, ඒ තැනැත්තා විසින් එම විධානයට අනුකූලව කටයුතු කිරීම පැහැර හරිනු ලැබුවහොත් -

(අ) (i) එම තැනැත්තා, ඔහුගේ අනුයෝජිතයන් සහ සේවකයන්, (2) වන උපවගන්තියේ විධිවිධාන

යටතේ පනවනු ලැබූ නියම හා කොන්දේසිවලට අනුකූලව ක්‍රියාකිරීම පැහැර හැරීම වළක්වාලමින්;

(ii) (අඅ) ඒ ඉඩම් ප්‍රමාණයෙහි සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හෝ ඉදිකරන ලද යම් ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් බිඳ හෙළීමට;

(අආ) පිරවීමේ දී හෝ ඉදිකිරීමේ දී භාවිත කරන ලද පස් සහ ද්‍රව්‍ය කැණීමට හෝ පොළොවෙන් හාරා ඉවත් කිරීමට සහ ඉවත් කිරීමට; සහ

(අඇ) එම පිරවීමට හෝ ඉදිකිරීමට යොදා ගන්නා ලද යම් මෙවලමක්, උපකරණයක්, යන්ත්‍රෝපකරණයක්, වාහනයක් හෝ ලේඛනයක් භාරයට ගැනීමට,

ප්‍රධාන විධායක නිලධරයාට බලය ප්‍රදානය කරමින්; සහ

(iii) (අඅ) යම් ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් බිඳ හෙළීමේ දී;

(අආ) පිරවීමේ දී හෝ ඉදිකිරීමේ දී භාවිත කරන ලද පස් සහ ද්‍රව්‍ය කැණීමේ දී හෝ පොළොවෙන් හාරා ඉවත් කිරීමේ දී සහ ඉවත් කිරීමේ දී; සහ

(අඇ) එම පිරවීමට හෝ ඉදිකිරීමට යොදා ගන්නා ලද යම් මෙවලමක්, උපකරණයක්, යන්ත්‍රෝපකරණයක්, වාහනයක් හෝ ලේඛනයක් භාරයට ගැනීමේ දී,

සංස්ථාව විසින් දරන ලද සමස්ත පිරිවැය අයකර ගැනීමට,

ආඥාවක් නිකුත් කිරීම සඳහා, ඒ ඉඩම් ප්‍රමාණය හෝ එහි යම් කොටසක් පිහිටියේ යම් මහෙස්ත්‍රාත්

අධිකරණයක අධිකරණ බලසීමාව ඇතුළත ද, ඒ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක්; හෝ

(ආ) නීති විරෝධී ක්‍රියාකාරකම කරගෙන යනු ලබන්නේ හෝ එම ක්‍රියාකාරකම සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක් සිදු කර ඇත්තේ යම් ඉඩම් ප්‍රමාණයක් හෝ එහි යම් කොටසක් ඇතුළත ද, ඒ ඉඩම් ප්‍රමාණය හෝ කොටස පිහිටා ඇති ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ ස්ථානභාර නිලධරයාට පැමිණිලි කිරීමක්,

ප්‍රධාන විධායක නිලධරයා විසින් කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 2ආ වන වගන්තිය සංශෝධනය කිරීම

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2ආ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (3) වන උපවගන්තියේ "මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය." යන වචන වෙනුවට, "වරදක් කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂයකට නොඅඩු සහ රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට හෝ වසරකට නොවැඩි කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (5) වන, (6) වන සහ (7) වන උපවගන්ති ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන්:-

"(5) යම් තැනැත්තකු (3) වන උපවගන්තියේ විධිවිධාන කඩකරමින් ක්‍රියා කරන බව ප්‍රධාන විධායක නිලධරයා වෙත දන්වනු ලැබ ඒ සම්බන්ධයෙන් ඔහු සෑහීමට පත්වන අවස්ථාවක-

(අ) (i) එම තැනැත්තා, ඔහුගේ අනුයෝජිතයන් සහ සේවකයන්, (3) වන උපවගන්තියේ විධිවිධාන කඩකරමින් ක්‍රියා කිරීම වළක්වාලමින්;

(ii) (අඅ) ඒ ඉඩම් ප්‍රමාණයෙහි සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හෝ ඉදිකරන ලද යම් ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් බිඳහෙළීමට;

(අආ) පිරවීමේ දී හෝ ඉදිකිරීමේ දී භාවිත කරන ලද පස් සහ ද්‍රව්‍ය කැණීමට හෝ පොළොවෙන් හාරා ඉවත් කිරීමට සහ ඉවත් කිරීමට; සහ

(අඇ) එම පිරවීමට හෝ ඉදිකිරීමට යොදා ගන්නා ලද යම් මෙවලමක්, උපකරණයක්, යන්ත්‍රෝපකරණයක්, වාහනයක් හෝ ලේඛනයක් භාරයට ගැනීමට,

ප්‍රධාන විධායක නිලධරයාට බලය ප්‍රදානය කරමින්; සහ

(iii) (අඅ) යම් ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් බිඳ හෙළීමේ දී;

(අආ) පිරවීමේ දී හෝ ඉදිකිරීමේ දී භාවිත කරන ලද පස් සහ ද්‍රව්‍ය කැණීමේ දී හෝ පොළොවෙන් හාරා ඉවත් කිරීමේ දී සහ ඉවත් කිරීමේ දී; සහ

(අඇ) එම පිරවීමට හෝ ඉදිකිරීමට යොදා ගන්නා ලද යම් මෙවලමක්, උපකරණයක්, යන්ත්‍රෝපකරණයක්, වාහනයක් භාරයට ගැනීමේ දී,

සංස්ථාව විසින් දරන ලද සමස්ත පිරිවැය අයකර ගැනීමට,

ආඥාවක් නිකුත් කිරීම සඳහා ඒ ඉඩම් ප්‍රමාණය හෝ එහි යම් කොටසක් පිහිටියේ යම් මහෙස්ත්‍රාත් අධිකරණයක අධිකරණ බලසීමාව ඇතුළත ද, ඒ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක්; හෝ

(ආ) නීති විරෝධී ක්‍රියාකාරකම කරගෙන යනු ලබන්නේ හෝ එම ක්‍රියාකාරකම සම්පූර්ණයෙන්ම හෝ එහි

කොටසක් සිදු කර ඇත්තේ යම් ඉඩම් ප්‍රමාණයක් හෝ එහි යම් කොටසක් ඇතුළත ද, ඒ ඉඩම් ප්‍රමාණය හෝ කොටස පිහිටා ඇති ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ ස්ථානභාර නිලධරයාට පැමිණිලි කිරීමක්,

ප්‍රධාන විධායක නිලධරයා විසින් කරනු ලැබිය හැකි ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 4අ වන වගන්තිය, එහි (3) වන, (4) වන, (5) වන, (6) වන සහ (7) වන උප වගන්ති ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 4අ වන වගන්තිය සංශෝධනය කිරීම

"(3) (2) වන උපවගන්තියේ විධිවිධාන කඩකරනු ලබන සෑම තැනැත්තකුම වරදක් කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂයකට නොඅඩු සහ රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට හෝ වසරකට නොවැඩි කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(4) යම් තැනැත්තකු (2) වන උපවගන්තියේ විධිවිධාන කඩකරමින් ක්‍රියාකරන බව ප්‍රධාන විධායක නිලධරයා වෙත දන්වනු ලැබ, ඒ සම්බන්ධයෙන් ඔහු සෑහීමට පත්වන අවස්ථාවක -

(අ) (i) එම තැනැත්තා, ඔහුගේ අනුයෝජිතයන් සහ සේවකයන් (2) වන උපවගන්තියේ විධිවිධාන කඩකරමින් ක්‍රියාකිරීම වළක්වාලමින්;

(ii) (අඅ) ඒ ඉඩම් ප්‍රමාණයෙහි සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හෝ ඉදිකරන ලද යම් ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් බිඳ හෙළීමට;

(අආ) පිරවීමේ දී හෝ ඉදිකිරීමේ දී භාවිත කරන ලද පස් සහ ද්‍රව්‍ය කැණීමට හෝ

පොළොවෙන් හාරා ඉවත් කිරීමට සහ ඉවත් කිරීමට; සහ

(අඇ) එම පිරවීමට හෝ ඉදිකිරීමට යොදා ගන්නා ලද යම් මෙවලමක්, උපකරණයක්, යන්ත්‍රෝපකරණයක්, වාහනයක් හෝ ලේඛනයක් භාරයට ගැනීමට,

ප්‍රධාන විධායක නිලධරයාට බලය ප්‍රදානය කරමින්; සහ

(iii) (අඅ) යම් ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් බිඳ හෙළීමේ දී;

(අආ) පිරවීමේ දී හෝ ඉදිකිරීමේ දී භාවිත කරන ලද පස් සහ ද්‍රව්‍ය කැණීමේ දී හෝ පොළොවෙන් හාරා ඉවත් කිරීමේ දී සහ ඉවත් කිරීමේ දී; සහ

(අඇ) එම පිරවීමට හෝ ඉදිකිරීමට යොදා ගන්නා ලද යම් මෙවලමක්, උපකරණයක්, යන්ත්‍රෝපකරණයක්, වාහනයක් හෝ ලේඛනයක් හෝ ලේඛන භාරයට ගැනීමේ දී,

සංස්ථාව විසින් දරන ලද සමස්ත පිරිවැය අයකරවා ගැනීමට,

ආඥාවක් නිකුත් කිරීම සඳහා ඒ ඉඩම් ප්‍රමාණය හෝ එහි යම් කොටසක් පිහිටියේ යම් මහෙස්ත්‍රාත් අධිකරණයක අධිකරණ බල සීමාව ඇතුළත ද, ඒ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක්; හෝ

(ආ) නීති විරෝධී ක්‍රියාකාරකම කරගෙන යනු ලබන්නේ හෝ එම ක්‍රියාකාරකම සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක් සිදු කර ඇත්තේ යම් ඉඩම් ප්‍රමාණයක් හෝ එහි යම් කොටසක් ඇතුළත ද, ඒ ඉඩම් ප්‍රමාණය හෝ කොටස පිහිටා ඇති ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ ස්ථානභාර නිලධරයාට පැමිණිලි කිරීමක්,

ප්‍රධාන විධායක නිලධරයා විසින් කරනු ලැබිය හැකි ය.

(5) (2) වන උපවගන්තිය යටතේ අනුමතය දෙන ලද්දේ යම් තැනැත්තකුට ද, ඒ තැනැත්තාට එම අනුමතය දෙනු ලැබුවේ යම් නියම සහ කොන්දේසිවලට යටත්ව ද, ඒ නියම සහ කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීම පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක, ප්‍රධාන විධායක නිලධරයා විසින් හෝ එම ප්‍රධාන විධායක නිලධරයා විසින් බලය පවරනු ලැබූ නිලධරයකු හෝ සේවකයකු විසින් කරනු ලබන විධානයේ නිශ්චිතව දක්වා ඇති කාලය ඇතුළත එකී නියම සහ කොන්දේසිවලට අනුකූලව කටයුතු කරන ලෙස විධාන කරනු ලැබිය යුතු අතර, ඒ තැනැත්තා විසින් එම විධානයට අනුකූලව කටයුතු කිරීම පැහැර හරිනු ලැබුවහොත් -

(අ) (i) එම තැනැත්තා, ඔහුගේ අනුයෝජිතයන් සහ සේවකයන් (2) වන උපවගන්තියේ විධිවිධාන කඩකරමින් ක්‍රියා කිරීමෙන් වළක්වාලමින්;

(ii) (අඅ) ඒ ඉඩම් ප්‍රමාණයෙහි සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හෝ ඉදිකරන ලද යම් ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් බිඳ හෙළීමට;

(අආ) පිරවීමේ දී හෝ ඉදිකිරීමේ දී භාවිත කරන ලද පස් සහ ද්‍රව්‍ය කැණීමට හෝ පොළොවෙන් හාරා ඉවත් කිරීමට සහ ඉවත් කිරීමට; සහ

(අඇ) එම පිරවීමට හෝ ඉදිකිරීමට යොදා ගන්නා ලද යම් මෙවලමක්, උපකරණයක්, යන්ත්‍රෝපකරණයක්, වාහනයක් හෝ ලේඛනයක් භාරයට ගැනීමට,

ප්‍රධාන විධායක නිලධරයාට බලය ප්‍රදානය කරමින්; සහ

(iii) (අඅ) යම් ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් බිඳ හෙළීමේ දී;

(අආ) පිරවීමේ දී හෝ ඉදිකිරීමේ දී භාවිත කරන ලද පස් සහ ද්‍රව්‍ය කැණීමේ දී හෝ පොළොවෙන් හාරා ඉවත් කිරීමේ දී සහ ඉවත් කිරීමේ දී; සහ

(අඇ) එම පිරවීමට හෝ ඉදිකිරීමට යොදා ගන්නා ලද යම් මෙවලමක්, උපකරණයක්, යන්ත්‍රෝපකරණයක්, වාහනයක් හෝ ලේඛනයක් භාරයට ගැනීමේ දී,

සංස්ථාව විසින් දරන ලද සමස්ත පිරිවැය අයකර ගැනීමට,

ආඥාවක් නිකුත් කිරීම සඳහා, ඒ ඉඩම් ප්‍රමාණය හෝ එහි යම් කොටසක් පිහිටියේ යම් මහෙස්ත්‍රාත් අධිකරණයක අධිකරණ බල සීමාව ඇතුළත ද, ඒ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක්; හෝ

(ආ) නීති විරෝධී ක්‍රියාකාරකම කරගෙන යනු ලබන්නේ හෝ එම ක්‍රියාකාරකම සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක් සිදු කර ඇත්තේ යම් ඉඩම් ප්‍රමාණයක් හෝ එහි යම් කොටසක් ඇතුළත ද, ඒ ඉඩම් ප්‍රමාණය හෝ කොටස පිහිටා ඇති ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ ස්ථානභාර නිලධරයාට පැමිණිලි කිරීමක්,

ප්‍රධාන විධායක නිලධරයා විසින් කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ (ii) සහ (iii) අනුඡේද ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ii) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු; සහ

(iii) (269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ ජාතික භෞතික නිර්මාණ අධ්‍යක්ෂ ජනරාල්වරයා; සහ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ඉඇ) සංස්ථාවේ පුහුණු ශ්‍රමය, විශේෂඥ දැනුම සහ පළපුරුද්ද උපයෝජනය කරමින් සංස්ථාවේ අරමුණු මුදුන්පත් කරවා ගැනීම සඳහා අමාත්‍යවරයාගේ එකගත්වය ඇතිව, ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත විදේශීය හෝ දේශීය සමාගම් හෝ පුද්ගලයන් සමඟ සෘජුව, ඒකාබද්ධව හෝ අන්‍යාකාරයෙන් බද්ධ ව්‍යාපාර, හවුල් ව්‍යාපාර හෝ වෙනත් වාණිජමය ගිවිසුම්වලට ඇතුළත් වීමට;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරනු ලැබේ:-

"වළක්වාලන ආඥාවක් ලබා ගැනීමට ඉල්ලුම් කිරීමෙහි ලා කාර්ය පටිපාටිය

20අ. (1) 2අ වන වගන්තියේ (5) වන හෝ (6) වන උපවගන්ති, 2ආ වන වගන්තියේ (5) වන උපවගන්තිය, 4අ වන වගන්තියේ (4) වන හෝ (5) වන උපවගන්ති හෝ 20ඇ වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ආඥාවක් ලබාගැනීම සඳහා වූ සෑම ඉල්ලීමක් ම, ඉල්ලීමෙන් ඉදිරිපත් කරනු ලබන කාරණා සත්‍යායනය කෙරෙන දිවුරුම් ප්‍රකාශයක් මගින් සනාථ කරනු ලැබිය යුතු ය.

(2) ඉල්ලීම ලැබීමෙන් පසු, (4) වන හෝ (8) වන උපවගන්තියේ විධිවිධාන යටතේ අතුරු ආඥාව නිශ්චිත කරනු ලබන තෙක් හෝ (8) වන උපවගන්තියේ විධිවිධාන යටතේ අතුරු ආඥාව අවලංගු කරනු ලබන තෙක්, 2අ වන වගන්තියේ (5) වන හෝ (6) වන උපවගන්තිවල හෝ 2ආ වන වගන්තියේ (5) වන උපවගන්තියේ හෝ 4අ වන වගන්තියේ (4) වන හෝ (5) වන උපවගන්තිවල හෝ 20ඇ වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන කඩකරනු ලැබ ඇති බවට මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත්වනු ලබන අවස්ථාවක, එම තැනැත්තා, ඔහුගේ අනුයෝජිතයන් සහ සේවකයන් එම නීති විරෝධී ක්‍රියාකාරකම කරගෙන යාම වළක්වාලමින් අතුරු ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(3) ඉල්ලීමෙන් අයැද ඇති පරිදි ඉල්ලීමෙහි නම් කර ඇති තැනැත්තා හෝ ඔහුගේ අනුයෝජිතයන් හෝ සේවකයන් වළක්වනු නොලැබිය යුතු වන්නේ මක් නිසාදැයි සිතාසියෙහි සඳහන් සිතාසිය නිකුත් කරන ලද දිනයේ සිට වැඩ කරන දින දහහතරක්

පසු නොවී එළඹෙන දිනයක් විය යුතු දිනයක ඉදිරිපත් වී හේතු දක්වන ලෙස මහෙස්ත්‍රාත්වරයා විසින් (2) වන උපවගන්තිය යටතේ අතුරු ආඥාව කර ඇති තැනැත්තා වෙත හෝ 2අ වන වගන්තියේ (5) වන හෝ (6) වන උපවගන්ති හෝ 2ආ වන වගන්තියේ (5) වන උපවගන්තිය හෝ 4අ වන වගන්තියේ (4) වන හෝ (5) වන උපවගන්ති හෝ 20ඇ වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ආඥාවක් ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කරනු ලැබ ඇති යම් තැනැත්තකුට එරෙහිව (2) වන උපවගන්තිය යටතේ මහේස්ත්‍රාත් අධිකරණය විසින් අතුරු ආඥාවක් කරනු ලැබ නොමැති අවස්ථාවක එම තැනැත්තා වෙත හෝ සිතාසි නිකුත් කරනු ලැබිය යුතු ය.

(4) එම අතුරු ආඥාව කරනු ලැබුවේ යම් තැනැත්තකුට එරෙහිව ද, එම තැනැත්තා (3) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් දින අධිකරණය ඉදිරියේ පෙනී සිටීම පැහැර හැරියහොත් හෝ ඉල්ලීමෙහි අයැද ඇති පරිදි, (2) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ අතුරු ආඥාව නිශ්චිත කිරීමට එරෙහිව දැක්වීමට කිසිම හේතුවක් එකී තැනැත්තාට නොමැති වුවහොත්, අධිකරණය විසින් වහාම ඉල්ලීමේ අයැද ඇති පරිදි අතුරු ආඥාව නිශ්චිත කරනු ලැබිය යුතු ය.

(5) අතුරු ආඥාවක් කරනු ලැබ නොමැති සහ (3) වන උපවගන්තිය යටතේ සිතාසි නිකුත් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකුට එරෙහිව ද, එම තැනැත්තා අධිකරණය ඉදිරියේ පෙනී සිටීම පැහැර හැරියහොත් හෝ ඉල්ලීමෙහි අයැද ඇති පරිදි, වළක්වාලන ආඥාවක් නිකුත් කිරීමට එරෙහිව දැක්වීමට කිසිම හේතුවක් එකී තැනැත්තාට නොමැති වුවහොත්, අධිකරණය විසින් වළක්වාලන ආඥාවක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(6) එම තැනැත්තා යථා පරිදි අධිකරණයේ පෙනී සිට අතුරු ආඥාව නිකුත් කිරීමට එරෙහිව හෝ වළක්වාලන ආඥාවක් නිකුත් කිරීමට එරෙහිව තමාට හේතු දැක්වීමට ඇතැයි ප්‍රකාශ කරන්නේ නම් අධිකරණය විසින් වහාම නඩුව විභාග කිරීම හෝ

යම් පසු දිනයක විභාග කිරීම සඳහා නියම කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(7) (අ) ඉඩමේ අදාළ ප්‍රදේශය මේ පනතේ 2 වන, 2අ වන හෝ 4අ වන වගන්ති යටතේ වන ඉඩමක් නොවන බව; හෝ

(ආ) 2අ වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ හෝ 4අ වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වන අනුමතයේ නියම සහ කොන්දේසිවලට අනුකූලව එම තැනැත්තා ක්‍රියාකර ඇති බවට හෝ 2ආ වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ නියමයක නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතා හා අනුකූලව ක්‍රියාකර ඇති බවට,

හේතු දැක්වීමට හැර, (3) වන උපවගන්තිය යටතේ සිතාසි නිකුත් කරනු ලැබ ඇති යම් තැනැත්තකුට නඩුව විභාග කිරීමේ දී (1) වන උපවගන්තිය යටතේ වන ඉල්ලීමක දක්වා ඇති යම් කරුණක් හබ කිරීමට අයිතියක් නොවිය යුතු ය.

(8) නඩුව විභාග කිරීමෙන් පසු මහෙස්ත්‍රාත්වරයා විසින් ඉල්ලීමෙහි අයැද ඇති පරිදි අතුරු ආඥාව නිශ්චිත කිරීම හෝ අතුරු ආඥාව අවලංගු කිරීම හෝ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම කරනු ලැබිය හැකි ය.

(9) (4) වන, (5) වන හෝ (8) වන උපවගන්ති යටතේ මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥාවක් කරනු ලැබ ඇති විට-

(අ) (i) ඒ ඉඩම ප්‍රමාණයේ සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හෝ ඉදිකරන ලද යම් ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් බිඳ හෙළීමට;

(ii) පිරවීමේ දී හෝ ඉදිකිරීමේ දී භාවිත කරන ලද පස් සහ ද්‍රව්‍ය කැණීමට හෝ

පොළොවෙන් හාරා ඉවත් කිරීමට සහ ඉවත් කිරීමට; සහ

(iii) එම පිරවීමට හෝ ඉදිකිරීමට යොදා ගන්නා ලද යම් මෙවලමක්, උපකරණයක්, යන්ත්‍රෝපකරණයක්, වාහනයක් හෝ ලේඛනයක් භාරයට ගැනීමට,

ප්‍රධාන විධායක නිලධරයාට; සහ

(ආ) (i) යම් ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් බිඳ හෙළීමේ දී;

(ii) පිරවීමේ දී හෝ ඉදිකිරීමේ දී භාවිත කරන ලද පස් සහ ද්‍රව්‍ය කැණීමේ දී හෝ පොළොවෙන් හාරා ඉවත් කිරීමේ දී සහ ඉවත් කිරීමේ දී;

(iii) පිරවීමේ දී හෝ ඉදිකිරීමේ දී භාවිත කරන ලද පස් සහ ද්‍රව්‍ය ඉවත් කිරීමේ දී; සහ

(iv) එම පිරවීමට හෝ ඉදිකිරීමට යොදාගන්නා ලද යම් මෙවලමක්, උපකරණයක්, යන්ත්‍රෝපකරණයක්, වාහනයක් හෝ ලේඛනයක් භාරයට ගැනීමේ දී,

දරන ලද සමස්ත පිරිවැය ගෙවන ලෙස ආඥාව නිකුත් කරනු ලැබුවේ යම් තැනැත්තකුට එරෙහිව ද, දරන ලද එම සමස්ත පිරිවැය ගෙවන ලෙස එම තැනැත්තාට,

මහෙස්ත්‍රාත්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.

(10) ප්‍රධාන විධායක නිලධරයා විසින් දිවුරුම් ප්‍රකාශයක් සමඟ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ වරලත් සිවිල් ඉංජිනේරුවරයකු විසින් සහතික කරන ලද ප්‍රකාශයේ නිශ්චිතව දක්වා ඇති පිරිවැය, සංස්ථාව විසින් දරනු ලැබූ පිරිවැය පිළිබඳ අවසාන හා තීරණාත්මක එකක් විය යුතු අතර, එම ආඥාව පැනවූ උසාවිය විසින් පනවන ලද දඩ මුදලක් අයකරගන්නා ආකාරයටම ආඥාව නිකුත් කරනු ලැබුවේ යම් තැනැත්තකුට එරෙහිව ද, එම

තැනැත්තාගෙන් එම පිරිවැය අයකර ගනු ලැබිය යුතු අතර, සංස්ථාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(11) (අ) (9) වන උපවගන්තිය යටතේ ආඥාවක් කරන ලදුව මහෙස්ත්‍රාත්වරයා විසින් ප්‍රධාන විධායක නිලධරයාට යම් මෙවලමක්, උපකරණයක්, යන්ත්‍රෝපකරණයක්, වාහනයක් හෝ ලේඛනයක් භාරයට ගැනීමට ආඥාවක් නිකුත් කොට ඇති අවස්ථාවක, එම මෙවලම, උපකරණය, යන්ත්‍රෝපකරණය, වාහනය හෝ ලේඛනය රාජසන්තක කිරීම සඳහා මහෙස්ත්‍රාත්වරයා විසින් (12) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව ආඥාවක් කරනු ලැබිය හැකි ය. එසේ රාජසන්තක කරන ලද යම් මෙවලමක්, උපකරණයක්, යන්ත්‍රෝපකරණයක්, වාහනයක් හෝ ලේඛනයක් සියලු බැඳීම්වලින් නිදහස්ව රජය වෙත පැවරිය යුතු ය. එම පැවරීම -

(i) අභියාචනාධිකරණය වෙත හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුත්තේ යම් කාලසීමාවක් ඇතුළත ද, ඒ කාලසීමාව ඉකුත් වීමෙන් පසු රාජසන්තක කිරීමේ ආඥාවට විරුද්ධව අභියාචනාධිකරණය වෙත හෝ ඒ මහාධිකරණය වෙත හෝ අභියාචනයක් කර නොමැති අවස්ථාවක; හෝ

(ii) රාජ්‍ය සන්තක කිරීමේ ආඥාවට විරුද්ධව අභියාචනාධිකරණය වෙත හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද මහාධිකරණය වෙත හෝ අභියාචනයක් කර ඇති අවස්ථාවක, රාජසන්තක කිරීමේ ආඥාව ස්ථිර කරමින් හෝ අනුමත කරමින් අභියාචනය පිළිබඳ තීරණයක් කිරීමෙන් පසු,

බලාත්මක විය යුතු ය.

(ආ) මේ වගන්තිය යටතේ රාජ්‍ය සතු වන යම් මෙවලමක, උපකරණයක, යන්ත්‍රෝපකරණයක, වාහනයක හෝ ලේඛනයක සන්තකය ප්‍රධාන

විධායක නිලධරයා විසින් ලබා ගත යුතු අතර, ඔහු විසින් සුදුසු යයි කල්පනා කරන පරිදි ඒවා විකිණීම හෝ අන්‍යාකාරයෙන් බැහැර කිරීම හෝ කරනු ලැබිය හැකි ය. එවැනි විකිණීමකින් ලැබෙන මුදල් සංස්ථාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(12) (9) වන උපවගන්තිය යටතේ ආඥාවක් කරන ලදුව, මහෙස්ත්‍රාත්වරයා විසින් ප්‍රධාන විධායක නිලධරයාට යම් මෙවලමක්, උපකරණයක්, යන්ත්‍රෝපකරණයක්, වාහනයක් හෝ ලේඛනයක් භාරයට ගැනීමට ආඥාවක් කොට ඇති අවස්ථාවක, එම මෙවලමේ, උපකරණයේ, යන්ත්‍රෝපකරණයේ, වාහනයේ හෝ ලේඛනයේ හිමිකරු තුන්වන පාර්ශ්වයක් වනවිට, එම හිමිකරු විසින් -

(අ) වරද කිරීම සඳහා, එම මෙවලම, උපකරණය, යන්ත්‍රෝපකරණය, වාහනය හෝ ලේඛනය භාවිත කිරීම වැළැක්වීමට අවශ්‍ය සියලු පූර්ව අවධානය ගෙන ඇති බවට; හෝ

(ආ) වරද සිදු කිරීම සඳහා එම මෙවලම, උපකරණය, යන්ත්‍රෝපකරණය, වාහනය හෝ ලේඛනය ඔහුගේ අනුදැනුමෙන් තොරව භාවිත කොට ඇති බවට,

අධිකරණය සෑහීමට පත්වන ආකාරයට සාධනය කරනු ලබන අවස්ථාවක, රාජසන්තක කිරීමේ ආඥාවක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

(13) ප්‍රධාන විධායක නිලධරයා හෝ ප්‍රධාන විධායක නිලධරයා විසින් බලය පවරන ලද නිලධරයකු හෝ සේවකයකු විසින් යම් අවහිර කිරීමක් හෝ විරෝධය පෑමක් සිදු වීම හේතුවෙන් හෝ අවහිර කිරීමක් හෝ විරෝධයක් පෑමක් සිදු වීමට ඉඩ ඇති වීම හේතුවෙන්-

(අ) (i) ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් බිඳ හෙළීමට;

(ii) භාවිත කරන ලද පස් සහ ද්‍රව්‍ය

කැණීමට හෝ පොළොවෙන් හාරා ඉවත් කිරීමට;

(iii) පිරවීමේ දී හෝ ඉදිකිරීමේ දී භාවිත කරන ලද පස් සහ ද්‍රව්‍ය ඉවත් කිරීමට; සහ

(iv) එම පිරවීම හෝ ඉදිකිරීම සඳහා භාවිත කරන ලද යම් මෙවලමක්, උපකරණයක්, යන්ත්‍රෝපකරණයක්, වාහනයක් හෝ ලේඛනයක් භාරයට ගැනීමට,

අසමත් වන හෝ අසමත් විය හැකි බවට සැක කරනු ලබන අවස්ථාවක, (9) වන උපවගන්තිය යටතේ ආඥාවක් කරන ලදුව, ප්‍රධාන විධායක නිලධරයා විසින් තත් කාර්ය සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතු අතර -

(අඅ) යම් ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් බිඳ හෙළීමට;

(අආ) භාවිත කරන ලද පස් සහ ද්‍රව්‍ය කැණීමට හෝ පොළොවෙන් හාරා ඉවත් කිරීමට;

(අඇ) පිරවීමට හෝ ඉදිකිරීමට භාවිත කරන ලද පස් සහ ද්‍රව්‍ය ඉවත් කිරීමට; සහ

(අඈ) එම පිරවීම හෝ ඉදිකිරීම සඳහා භාවිතා කරන ලද යම් මෙවලමක්, උපකරණයක්, යන්ත්‍රෝපකරණයක්, වාහනයක් හෝ ලේඛනයක් භාරයට ගැනීමට,

පිස්කල්වරයාට නියම කරනු ලබන ආඥාවක් එම අධිකරණයෙන් නිකුත් කරනු ලැබීමට හිමිකමක් ලැබිය යුතු ය.

(ආ) දිව්රුම් ප්‍රකාශයක් මගින් ආධාරිත සෑම ඉල්ලීමක් ම එහි ප්‍රකාශිත කරුණු පිළිබඳ තීරණාත්මක සාක්ෂි විය යුතු ය.

(ඇ) (අ) ඡේදය යටතේ ආඥාවක් නිකුත් කරනු ලැබ ඇත්තේ යම් පිස්කල්වරයකුට ද, එම පිස්කල්වරයා විසින් වහාම එම ආඥාව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු අතර, එම ආඥාව ක්‍රියාත්මක කරනු ලැබූ ආකාරය පිළිබඳව අධිකරණයට ලිඛිතව වාර්තා කරනු ලැබිය යුතු ය.

(ඈ) පිස්කල්වරයා විසින් යම් ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් බිඳ හෙළීමේ දී, භාවිත කරන ලද පස් සහ ද්‍රව්‍ය කැණීමේ දී හෝ පොළොවෙන් හාරා ඉවත් කිරීමේ දී සහ පිරවීමට හෝ ඉදිකිරීමට භාවිත කරන ලද සියලු පස් සහ ද්‍රව්‍ය ඉවත් කිරීමේ දී සහ එම පිරවීමට හෝ ඉදිකිරීමට භාවිත කරන ලද යම් මෙවලමක්, උපකරණයක්, යන්ත්‍රෝපකරණයක්, වාහනයක් හෝ ලේඛනයක් භාරයට ගැනීමේ දී එම බිඳහෙළීමට, කැණීමට, පොළොවෙන් හාරා ඉවත් කිරීමට, ඉවත් කිරීමට හෝ භාරයට ගැනීමට දරන ලද සමස්ත පිරිවැය, (9) වන උපවගන්තිය යටතේ ආඥාවක් නිකුත් කරනු ලැබුවේ යම් තැනැත්තකුට එරෙහිව ද, එම තැනැත්තා විසින් ගෙවනු ලැබිය යුතු අතර, එම අධිකරණය මගින් පැනවූ දඩ මුදලක් අයකර ගනු ලබන ආකාරයට ම එම දරනු ලැබූ පිරිවැය අයකර ගනු ලැබිය යුතු ය.

(ඉ) (අ) ඡේදය යටතේ ආඥාවක් කොට ඇති අවස්ථාවක, පිස්කල්වරයා විසින් භාරයට

ගෙන ඇති සියලු මෙවලම්, උපකරණ, යන්ත්‍රෝපකරණ, වාහන හෝ ලේඛන (ඊ) ඡේදයේ විධිවිධානවලට යටත්ව රාජසන්තක විය යුතු ය.

(ඊ) යම් මෙවලමක්, උපකරණයක්, යන්ත්‍රෝපකරණයක්, වාහනයක් හෝ ලේඛනයක් භාරයට ගැනීමට (අ) ඡේදය යටතේ ආඥාවක් කොට ඇති අවස්ථාවක, එම මෙවලමේ, උපකරණයේ, යන්ත්‍රෝපකරණයේ, වාහනයේ හෝ ලේඛනයේ හිමිකරු තුන්වන පාර්ශ්වයක් වනවිට, එම හිමිකරු විසින් -

(i) වරද කිරීම සඳහා එම මෙවලම, උපකරණය, යන්ත්‍රෝපකරණය, වාහනය හෝ ලේඛනය භාවිත කිරීම වැළැක්වීමට අවශ්‍ය සියලු පූර්ව අවධානය ගෙන ඇති බවට; හෝ

(ii) වරද සිදුකිරීම සඳහා එම මෙවලම, උපකරණය, යන්ත්‍රෝපකරණය, වාහනය හෝ ලේඛනය ඔහුගේ අනුදැනුමෙන් තොරව භාවිත කොට ඇති බවට,

අධිකරණය සෑහීමට පත් වන ආකාරයට සාධනය කරනු ලබන අවස්ථාවක, රාජසන්තක කිරීමේ ආඥාවක් කරනු නොලැබිය යුතු ය.

(14) අමාත්‍යවරයා විසින් ඉල්ලීම්වල සහ දිව්රුම් ප්‍රකාශයේ ආකෘති පත්‍ර නියෝග මගින් නියම කරනු ලැබිය හැකි ය.”.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 20ඇ වන වගන්තියේ “සංස්ථාව විසින් ඉල්ලීමක් කරනු ලැබීමේ දී” යන වචන වෙනුවට “ප්‍රධාන විධායක නිලධරයා විසින් ඉල්ලීමක් කරනු ලැබීමේ දී” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20ඇ වන වගන්තිය සංශෝධනය කිරීම

ප්‍රධාන ප්‍රඥප්තියේ 20ඈ සහ 20ඉ අලුත් වගන්ති ඇතුළත් කිරීම

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20ඇ වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා එම ප්‍රඥප්තියේ 20ඈ සහ 20ඉ වන වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය:-

"පොලිස් නිලධරයකු විසින් අනුගමනය කළ යුතු කාර්ය පාටිපාටිය.

20ඈ. (1) (අ) 2අ වන වගන්තියේ (5) වන උපවගන්තියේ (ආ) ඡේදය, 2අ වන වගන්තියේ (6) වන උපවගන්තියේ (ආ) ඡේදය, 2ආ වන වගන්තියේ (5) වන උපවගන්තියේ (ආ) ඡේදය, 4අ වන වගන්තියේ (4) වන උපවගන්තියේ (ආ) ඡේදය හෝ 4අ වන වගන්තියේ (5) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පැමිණිල්ලක් කරනු ලැබ ඇති විට, එම පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් එම වරද සංඥෙය වරදක් කරනු ලැබූ සේ සලකා යම් මෙවලමක්, උපකරණයක්, යන්ත්‍රෝපකරණයක්, වාහනයක් හෝ ලේඛනයක් ද සමග එම වරද සිදු කිරීමට සම්බන්ධ සියලු තැනැත්තන් භාරයට ගනු ලැබිය යුතු ය.

(ආ) මේ පනතේ අර්ථානුකූලව සංඥෙය වරදක් යනු, පොලිස් නිලධරයකු විසින් වරෙන්තුවක් නොමැතිව තැනැත්තකු පළමු අවස්ථාවේ දී ම අත්අඩංගුවට ගත හැකි වරදක් වන්නේ ය.

(ඇ) මේ පනත යටතේ වන සියලු වැරදි ඇප දිය නොහැකි වරදවල් විය යුතු අතර, 1997 අංක 30 දරන ඇප පනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ භාරයට ගනු ලැබූ එකී සියලු තැනැත්තන් සහ යම් මෙවලමක්, උපකරණයක්, යන්ත්‍රෝපකරණයක්, වාහනයක් සහ ලේඛනයක් වහාම මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) 2අ වන වගන්තියේ (3) වන උපවගන්තිය, 2ආ වන වගන්තියේ (3) වන උපවගන්තිය හෝ 4අ වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ වන වරදකට තැනැත්තකු වරදකරු කරනු ලැබූ විට, එම වරද කරනු ලැබුවේ යමකට එරෙහිව ද, අධිකරණය විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් කාලසීමාවක් ඇතුළත-

(අ) යම් ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් බිඳ හෙළීමට; සහ

(ආ) පිරවීමේ දී හෝ ඉදිකිරීමේ දී භාවිත කරන ලද පස් හෝ ද්‍රව්‍ය කැණීමට හෝ හාරා ඉවත් කිරීමට සහ ඉවත් කිරීමට,

එම තැනැත්තාට ආඥාවක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(4) 2අ වන වගන්තියේ (3) වන උපවගන්තිය, 2ආ වන වගන්තියේ (3) වන උපවගන්තිය හෝ 4අ වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ තැනැත්තකු වරදකට වරදකරු කරනු ලැබීමෙන් පසු එසේ වරදකරු කරනු ලැබූ තැනැත්තා විසින්, වරදකරු කිරීමෙන් පසු ද, ඒ වරද අඛණ්ඩව කරගෙන යන එවැනි සෑම දිනයක් සඳහා ම රුපියල් දහසක් බැගින් වූ දඩයක් ඒ තැනැත්තා විසින් ගෙවනු ලැබිය යුතු ය.

(5) (අ) 2අ වන වගන්තියේ (3) වන උපවගන්තිය, 2ආ වන වගන්තියේ (3) වන උපවගන්තිය හෝ 4අ වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ, තැනැත්තකු වරදකට වරදකරු කරනු ලැබීමේ දී, එම වරද සිදු කිරීම සඳහා එම තැනැත්තා විසින් භාවිත කරනු ලැබූ සියලු මෙවලම්, උපකරණ, යන්ත්‍රෝපකරණ, වාහන හෝ ලේඛන (ආ) ඡේදයේ විධිවිධානවලට යටත්ව රාජසන්තක කරනු ලැබිය යුතු ය.

(ආ) යම් මෙවලමක, උපකරණයක, යන්ත්‍රෝපකරණයක, වාහනයක හෝ ලේඛනයක හිමිකරු තුන්වන පාර්ශ්වයක් වන අවස්ථාවක, එම හිමිකරු විසින්-

(i) වරද කිරීම සඳහා එම මෙවලම, උපකරණය, යන්ත්‍රෝපකරණය, වාහනය හෝ ලේඛනය භාවිත කිරීම වැළැක්වීමට අවශ්‍ය සියලු පූර්ව අවධානය ගෙන ඇති බවට; හෝ

(ii) වරද සිදුකිරීම සඳහා එම මෙවලම, උපකරණය, යන්ත්‍රෝපකරණය, වාහනය හෝ ලේඛනය ඔහුගේ අනුදැනුමෙන් තොරව භාවිත කොට ඇති බවට,

අධිකරණය සෑහීමට පත් වන ආකාරයට සාධනය කරනු ලබන අවස්ථාවක, රාජසන්තක කිරීමේ ආඥාවක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

පුද්ගල මණ්ඩලයක් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් කරනු ලබන වැරදි

20ඉ. මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ වන වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් වරදක් සිදු කරනු ලබන අවස්ථාවක දී, එම පුද්ගල මණ්ඩලය-

(අ) සංස්ථාපිත මණ්ඩලයක් වේ නම්, ඒ සංස්ථාපිත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකු, නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු; හෝ

(ආ) හවුල් ව්‍යාපාරයක් වේ නම් ඒ හවුල් ව්‍යාපාරයේ සෑම හවුල්කරුවකු, සේවකයකු හෝ අනුයෝජිතයකු ම,

ඒ වරදට වරදකරු විය යුතු ය:

එසේ වුව ද,අවස්ථාවෝචිත පරිදි, සංස්ථාපිත මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු, නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු හෝ හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු, නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු, ඔහු විසින්, තමාගේ දැනීමෙන් තොරව ඒ වරද සිදු කර ඇති බවට හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීමට අවශ්‍ය වූ නිසි උද්‍යෝගයෙන් ඔහු ක්‍රියා කළ බවට අධිකරණය සෑහීමට පත් වන පරිදි ඔහු විසින් ඔප්පු කරනු ලැබ ඇත්නම් ඒ වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.".

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22අ වන වගන්තියේ "දණ්ඩනයක් නියම කර නොමැති වරදකට වරදකරු වන සෑම තැනැත්තකුම" යන වචන වෙනුවට, "දණ්ඩනයක් නියම කර නොමැති වරදකට වරදකරු වන සෑම තැනැත්තකුම මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකට වරදකරු කරනු ලැබීමේ දී" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 22අ වන වගන්තිය සංශෝධනය කිරීම

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම

"(1) "සංස්ථාව" යන යෙදුමේ අර්ථ නිරූපණයට පෙරාතුව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

"ප්‍රධාන විධායක නිලධරයා" යන්නෙන්, පනතේ 14 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලබන සාමාන්‍යාධිකාරිවරයා අදහස් වේ; සහ

(2) "සංස්ථාව" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ.".

**12.** මේ පනතේ ආරම්භක දිනට පෙරාතුව ම වූ දිනය වනවිට පවතින හෝ අවසන් නොවූ සියලු නඩු, නඩු පැවරීම් සහ නීති කෘත්‍යයන් මේ පනතේ ආරම්භක දිනයෙන් පසු ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා පනතේ විධිවිධාන සංශෝධනය කරනු නොලැබූ ලෙස සලකා පවත්වාගෙන ගොස් අවසන් කරනු ලැබිය යුතු ය.

අන්තර්කාලීන විධිවිධානය

**13.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.